# ලෝක සරණාගත ප්‍රස්තුතය අභිමුඛ ශ්‍රී ලංකා රජයේ කාර්යභාරය පිළිබඳ විමර්ශනය

*ඒ.ටී.සී. ප්‍රනාන්දු*[1]

සරණාගතයන් පිළිබඳ ප්‍රස්තුතය සමස්ත ලෝකයටම විසඳාගත නොහැකි වූ මානුෂීය අර්බුදයකි. ජාති, කුල,ආගම්, සමාජ හෝ යුද්ධය, ප්‍රචණ්ඩත්වය හේතුවෙන් තම රට හැරයාමට බල කෙරුණු පුද්ගලයින් සරණාගතයින් ලෙස හැඳින්වේ. එවන් සරණාගත සංක්‍රමණිකයන් විසින් ජීවත් වීමට බියෙන් තොර භූමියක්, සරණයක් සොයමින් තවත් රටකට සරණය සොයා පැමිණේ. සරණාගතයින් පිළිබඳ ප්‍රස්තුතය සමස්ථ ලෝකය විසින්ම ආමන්ත්‍රණය කළ යුතු ගෝලීය ගැටලුවක් බවට එසේ නිර්මාණය විය. 1951 සරණාගතයන් පිළිබඳ සම්මුතිය හා එහි 1967 ප්‍රොටොකෝලය සරණාගතයන් වෙනුවෙන් ජාත්‍යන්තරය තුළ ගොඩනගා ගන්නා ලද සරණාගතයන් පිළිබඳ නෛතික රාමුවයි. එහිදී ශ්‍රී ලංකාව සරණාගතයන් පිළිබඳ 1951 සම්මුතියෙහි පාර්ශවකරුවෙකු නොවේ. නමුත් සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය හා අත්සන් තබන ලද කෙටිකාලීන විසඳුම් ලබාදීමේ අවබෝධතා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සරණාගතයින් සම්බන්ධව කටයුතු කරනු ලැබේ.ඒ මත පදනම්ව මෙම පර්යේෂණයේ න්‍යායාත්මක පදනම ගොඩ නගා ගෙන ඇත. ඒ අනුව මෙම පර්යේෂණය මගින් මෙරටට පැමිණෙන සරණාගතයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ කාර්යයභාරය පිළිබඳ විමර්ශනයක් සිදු කෙරේ. පර්යේෂණයට අදාළව ජාතිකව හා ජාත්‍යන්තරව සිදු කරන ලද සාහිත්‍යය විමර්ශනය තුළින් හෙළි වූයේ ශ්‍රී ලංකාව තුළ මීට පෙර මෙවැනි පර්යේෂණයක් සිදු කර නොමැති බවයි. ඒ තුළින් පර්යේෂණ හිඩැස මතු කරන්නා ලදී. මෙරටට සංක්‍රමණය වන සරණාගතයින්ගේ නෛතික පදනම, ඔවුන්ගේ ආහාරපාන, සෞඛ්‍ය තත්වය, අධ්‍යාපන අවස්ථා, වාසස්ථාන ආදී සරණාගතයින්ගේ ජීවන තත්වය සම්බන්ධව රජයේ කාර්යභාරය මැන බැලීම මෙම පර්යේෂණය මූලිකව අරමුණු කරගෙන ඇත. එහිදී අධ්‍යයන ප්‍රදේශය ලෙස මීගමුව ධීවර සහයෝගීතා ව්‍යාපාරයේ අධීක්ෂණය යටතේ රැඳී සිටින සරණාගත ප්‍රජාව තෝරාගන්නා ලදී. ඒ අතුරින් 50 කුගෙන් යුත් නියැදියක් තෝරා ගනු ලැබූ අතර එම නියැදිය සරණාගතයන් 40 දෙනකු ගෙන් ද,රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් 10 දෙනෙකුගෙන්ද සමන්විත වේ.මෙම පර්යේෂණය ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත දෙවර්ගයම භාවිතා කරමින් සිදු කරනු ලබන ගුණාත්මක අධ්‍යයනයකි. ප්‍රාථමික දත්ත සහභාගී නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරගත් අතර ද්වීතික දත්ත පොත්පත්,සගරා,ලිපි, අන්තර්ජාලය යටතේ රැස්කර ගන්නා ලදී.මෙම පර්යේෂණය තුළින් ලබා ගන්නා ලද අවසාන නිගමනය වූයේ ශ්‍රී ලංකාව තුළ සරණාගතයන් වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කලයුතු බවයි.

***ප්‍රමුඛ පදඃ*** සරණාගතයින්, ලෝක සරණාගත ප්‍රස්තුතය, 1951 සරණාගත සම්මුතිය, ශ්‍රී ලංකා රජය, සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය

[1] දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. chashminifdo@gmail.com